දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ද්විතීය භාග 2013 පරීක්ෂණය - 2016 ජනවාරි/පෙබරවාරි
Bachelor of Arts General (External) Degree Part II 2013 Examination – January/February 2016

# භූවිසා 3.2 - ප්‍රාදේශීය භූගෝල විද්‍යාව
# GYG 3.2 - Regional Geography

කාලය පැය තුන යි

**ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න**

01. i. 'ප්‍රදේශ (Regions) යනු පෘථිවි තලයේ ඇති විවිධත්වය අතුරින්, කිසියම් ආකාරයකින් වෙන් කොට හඳුනාගත හැකි එක්තරා භූගෝලීය ඒකකයකි' මෙය අර්ථවත්ව පැහැදිලි කරන්න.

(ලකුණු 10 යි)

ii. භූගෝල විද්‍යා විෂයෙහි 'ප්‍රදේශ' පිළිබඳ අධ්‍යයනයේ ඇති වැදගත්කම පහදන්න.

(ලකුණු 10 යි)

02. i. ගෝලීයකරණය (Globalization) හා ප්‍රාදේශීයකරණය (Regionalization) යන වදන් හි පවත්නා වෙනස්කම් සැකෙවින් ඉදිරිපත් කරන්න.

(ලකුණු 10 යි)

ii. ප්‍රාදේශීයකරණයට අනුබලවන සාධකවල බලපෑම සුදුසු නිදසුන් ඇසුරින් විමර්ශණය කරන්න.

(ලකුණු 10 යි)

03. 'ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව වියපත්වෙමින් පවතියි'

i. ප්‍රමාණවත් දත්ත හා තොරතුරු පාදක කර ගනිමින් ඉහත ප්‍රකාශය සත්‍යයෝක්ෂණය කරන්න.

(ලකුණු 10 යි)

ii. ඒ මගින් ඇතිවිය හැකි සමාජ ආර්ථික ප්‍රතිඵල විභාග කරන්න.

(ලකුණු 10 යි)

04. 'ශ්‍රී ලංකාවේ ජාතික හා ප්‍රාදේශීය සංවර්ධනයේ නියාමක බලවේගය සංචාරක කර්මාන්තයයි.' සංචාරක කර්මාන්තයේ විභවතා හා ප්‍රතිලාභ පිළිබඳ සැලකිලිමත් වෙමින් ඉහත ප්‍රකාශය විමර්ශණය කරන්න.

(ලකුණු 20 යි)

05. i. මානව සංවර්ධන දර්ශකය (Human Development Index) ගණනය කරන අයුරු සුදුසු උදාහරණ සපයමින් පැහැදිලි කරන්න.

(ලකුණු 12 යි)

ii. ශ්‍රී ලංකාවේ මානව සංවර්ධන දර්ශකයේ අගය අග්නිදිග ආසියාතික කලාපයේ රටවල්වල මානව සංවර්ධන දර්ශකයේ අගයන් හා සසඳන්න.

(ලකුණු 08 යි)

06. ප්‍රාදේශීය සංවර්ධනය නංවාලීම සඳහා ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවල (Local Authotities) කාර්යභාරය පැහැදිලි කරන්න.

(ලකුණු 20 යි)

07. i. ජාතික භෞතික සැලැස්ම (National Physical Plan) යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 08 යි)

ii. සපයා ඇති ශ්‍රී ලංකා සිතියම ඇසුරින් ජාතික භෞතික සැලැස්මේ ප්‍රධාන අංශ 04 ක් වත් ලකුණු කර ඒවා ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය සංවර්ධනයට දායක වන අයුරු පහදන්න.

(3x4 ලකුණු 12 යි)

08. i. ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ සංවර්ධනය ශ්‍රී ලංකාවේ අනෙකුත් පළාත්වල තත්ත්වය හා සංසන්දනය කර දක්වන්න.

(ලකුණු 12 යි)

ii. ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ අවිධිමත් සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රමවත් කිරීමේ රජයේ වැඩපිළිවෙල පහදන්න.

(ලකුණු 08 යි)